# විවිධත්වය නැති කරන බටහිර විද්‍යාවට පිළිතුරක්

එක් දහස් නව සිය විසි ගණන්වල දී, බටහිර විද්‍යාවේ එතෙක් පැවැති සුසමාදර්ශය වෙනස් කරමින් නිව්ටෝනීය යාන්ත්‍රිකයේ ප්‍රවාද වෙනුවට ක්වොන්ටම් යාන්ත්‍රණයේ ප්‍රවාද ආදේශ වන්නට ගැනිණි. මේ නව සුසමාදර්ශයට අනුව යම්කිසි පරීක්ෂණයක ප්‍රතිඵලය පිළිබඳව ඊට කලින් නිවැරැදි අනාවැකියක් පළ කළ නොහැකි ය. උපරිම වශයෙන් කළ හැක්කේ කිසියම් ප්‍රතිඵලයක් ලැබීමට ඇති සම්භාවිතාව ගණනය කිරීම පමණකි. අවිනිශ්චිතතාවය නුරුස්සන යුරෝපීයයන්ට මෙය එතරම් හිතට සමීප වූ දෙයක් නො වේ. මේ නිසා අද පවා බටහිර ස්වාභාවික දැනුම ලෙස පිළිගැනෙන්නේ නිව්ටෝනීය යාන්ත්‍රිකයේ ප්‍රවාද මිස ක්වොන්ටම් යාන්ත්‍රණයේ ප්‍රවාද නො වේ. මේ නිසා භෞතික විද්‍යාව පසුපසින් එන සමාජ දේශපාලන සහ ආර්ථික විද්‍යාවන් ද තම මූලික පදනම ලෙස නිව්ටෝනීය යාන්ත්‍රණය ම අනුගමනය කරයි.

නිව්ටන් ගේ චලිතය පිළිබඳ නියම තුළ සැඟවුණු නිව්ටන් නො කී දෙයක් මෙහි දී අපට වැදගත් වේ. එනම් ඕනෑ ම අවස්ථිතික රාමුවක කෙරෙන චලිතය පිළිබඳ පරීක්ෂණයකින් එම අවස්ථිතික රාමුවේ වේගය නිර්ණය කරගත නොහැකි බව ය. උදාහරණයක් ලෙස අපි පන්දුවක් උඩ දමමින් සිටින්නකු සහ එය නිරීක්ෂණය කරන්නකු සලකමු. දැන් මේ දෙදෙනා ම ඒකාකාර වේගයෙන් ගමන් ගන්නා දුම්රියක සිටින්නේ යැයි සලකමු. නිරීක්ෂකයා කොයි තරම් සූක්ෂම ලෙස අධ්‍යයනය කළ ද පන්දුවේ චලිතය ආධාරයෙන් ඔවුන් ගමන් කරන දුම්රියේ වේගය නිගමනය කිරීමට නොහැකි ය. වෙනත් අයුරකින් කියතොත් පොළොවේ සිටින නිරීක්ෂකයා ගේත් දුම්රියේ ගමන් කරන නිරීක්ෂකයා ගේත් චලිතය අතර වෙනසක් පන්දුවේ චලිතය නිරීක්ෂණයෙන් දැනගත නොහැකි ය. ඉහත සඳහන් ප්‍රකාශය අවස්ථිතික රාමුවල පමණක් ක්‍රියාත්මක වන නිව්ටෝනීය යාන්ත්‍රණයටත් අයින්ස්ටයින් ගේ සාපේක්ෂතාවාදයටත්, පොදුවේ සම්භාව්‍ය භෞතික විද්‍යාවටත් වලංගු වේ. එසේ නම් භෞතික විද්‍යාව පසුපස එන සමාජ විද්‍යාවන්ට ද මේ නිරීක්ෂණයන් පිළිබඳ සංකල්පය බලපානු ඇත.

සමාජ, ආර්ථික හා දේශපාලන විද්‍යා ප්‍රවාදයන්ට අදාළ වන්නේ මිනිසුන් ගේ චර්යාවන් හා ඔවුන් අතර සම්බන්ධතාවන් ය. මේ ප්‍රවාද ගෙතීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් නම් මිනිසුන් අතර (උදා- දේශපාලන අදහස්, ආර්ථික ක්‍රියාකාරකම්) ඇති යම් වෙනස්කම් ය. මිනිසුන් සමූහයක් ගත් කල ඔවුන් අතර පවතින යම් අර්බුදයක් විස්තර කළ හැක්කේ එකිනෙකා අතර වෙනස් ව ඇති යම් ගුණයක් ඇසුරෙන් මිස එකිනෙකා අතර සම ව පවතින ගුණයක් ඇසුරෙන් නො වන බව පැහැදිලි ය. අදාළ රාමුව තුළ මිනිස් සංචිතයේ සියලු ගුණ එක හා සමාන නම් අපට ප්‍රවාද ගොඩනැගිය හැක්කේ ඔවුන් මත ඇති කරන බාහිර බලපෑම් හා ඒ නිසා ඇති වන අර්බුද ගැන පමණකි. බාහිර බලපෑමක් නොමැති ව ඇතුළතින් හටගත් අර්බුදයක් ගැන ප්‍රවාදයක් ගොඩනැගීමට නම් විවිධ මිනිසුන් ගේ ගතිගුණ හා චර්යාවන් වෙනස් ලෙස දැන ගැනීම සඳහා ප්‍රවාදයක් තිබිය යුතු ය. මෙහි දී සංචිතයේ සිටින සෑම මිනිසකු ම නිරීක්ෂකයකු වන අතර ඔහු සංචිතයේ සෙසු සාමාජිකයින් ගේ නිරීක්ෂණයට භාජනය වන්නෙක් ද වේ. දැන් අපට ප්‍රශ්නය මේ නිරීක්ෂකයන්ට තම තමන් අතර වෙනස යම්කිසි ප්‍රවාදයක් ඇසුරෙන් ම පමණක් දැනගත හැකි ද යන්න ය.

එවැනි ප්‍රවාදයක් සම්භාව්‍ය භෞතික විද්‍යාවට අදාළ සුසමාදර්ශයේ පහළ විය නොහැකි බව පැහැදිලි ය. නිව්ටෝනීය යාන්ත්‍රිකයේත් අයින්ස්ටයිනීය සාපේක්ෂතා-වාදයේත් අවස්ථිතික රාමුවල සිටින නිරීක්ෂකයන් වෙන් කර හඳුනාගත නොහැකි ය. මීට අමතරව සමාජ විද්‍යාඥයින් සංස්කෘතිය, ජාතිය වැනි සංකල්ප ගැන පවා සංගත ප්‍රවාදයන් ගොඩනගා නැත. මේ කෙසේ වෙතත් සමාජ විද්‍යාඥයන් මින් පසුබට වී ඇති බවක් නම් නො පෙනේ.

ප්‍රවාදයක් නොමැති වුවත් බටහිර සමාජ විද්‍යාඥයෝ මිනිසුන් අතර වෙනස්කම් තම අත්දැකීම් ඇසුරෙන් දැනගනිති. මෙසේ දැනගත් වෙනස්කම් ඔවුන් විසින් ප්‍රවාදකරණයේ දී සාමාන්‍යයෙන් භාවිත කෙරෙන්නේ පහත දැක්වෙන අයුරෙනි. ප්‍රථමයෙන් සංයුතියේ සිටින සියල්ලන් වියුක්ත, එකිනෙකා ගෙන් ස්වායත්ත මිනිසුන් යැයි සලකනු ලැබේ. දෙවනුව තම අත්දැකීමෙන් දැනගත් එකිනෙකට වෙනස් මිනිස් ගුණ ඒ ඒ අදාළ මිනිසාට ආරෝප කෙරේ. තුන්වනුව මේ අලවන ලද ලේබලවලට අදාළව සංයුතියෙන් ලබාගන්නා සංගණන අනුව අර්බුදයේ නොයෙකුත් නිරීක්ෂණ විශ්ලේෂණය කෙරේ.

මේ විධි ක්‍රමයෙ යම් යාන්ත්‍රික බවක් ඇති බව බැලූ බැල්මට පෙනේ. එමෙන් ම නිව්ටෝනීය යාන්ත්‍රිකයේ අවස්ථිතික රාමුවල වේගය යම් නිරපේක්ෂ රාමුවකට සාපේක්ෂව ලබා ගන්නා සේ ම මෙහි දී මිනිසුනට ලේබල් ඇලවීම කෙරෙන්නේ බටහිර විද්‍යාඥයා විසින් ය. එපමණක් නො ව මෙසේ ගොඩනගා ගන්නා ප්‍රවාද මඟින් කෙරෙන්නේ යම් සමාජ ආර්ථික හෝ දේශපාලන අර්බුදයක විස්තරයක් මිස, මිනිසුන් මේ අර්බුදයට යොමු කෙරුණ හේතු පිළිබඳ විග්‍රහයක් නො වේ. මෙය එතරම් පුදුමයක් නො වේ. නිව්ටන් ගේ චලිතය පිළිබඳ නියමවලින් කියවෙන්නේ ද ගුරුත්වාකර්ෂණය ඇති වන්නේ මන්ද යන්න නො ව පොළොවට සාපේක්ෂව වස්තුවල චලිතය පිළිබඳ ගුරුත්වාකර්ෂණය නම් සංකල්පයක් අළලා කෙරෙන විස්තරයකි.

කරුණු මෙසේ තිබිය දී අසූවේ දශකයේ අග භාගයේ දී පමණ මහාචාර්ය නලින් ද සිල්වා විසින් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ඉදිරිපත් කෙරිණි. බටහිරුන්ට ක්වොන්ටම් යාන්ත්‍රණය මෙන් නො ව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ලාංකික ජනතාවට වඩා සමීප බවක් දක්වයි. මේ බව අවුරුදු විස්සක් වැනි කෙටි කාලයක් තුළ ඒ මත පදනම් වී බිහි වී ඇති ප්‍රවාදවල සමාජ සම්මතභාවයෙන් පෙනී යයි.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට අනුව දැනුම හුදෙක් මනසේ නිර්මාණ වේ. මේ නිර්මාණ මිනිසා ගේ චින්තනයට අනුව ලබාගත් දැනුමට සාපේක්ෂ වේ.

දැන් අපි කලින් සඳහන් කළ මිනිස් සංයුතියේ සිටින නිරීක්ෂකයන් දෙස නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ ඇසින් බලමු. මේ වාදයට අනුව නිරීක්ෂකයන්ට තමන් ගේත් අනුන් ගේත් ගුණ පිළිබඳව තම චින්තනයට අනුව යම් ප්‍රවාදයන් ගොතා ගැනීමට හැකි ය. මේ ප්‍රවාදයන් මඟින් වෙනස් ගුණ ඇති නිරීක්ෂකයන් වෙන් කර හඳුනාගත හැකි ය. මේ ප්‍රවාද තවදුරටත් වර්ධනය කරගනිමින් ගුණ වෙනස් නිරීක්ෂකයන් අතර අන්‍යෝන්‍ය ක්‍රියාවන් පිළිබඳව ද යම් ප්‍රවාද ගොඩනැඟිය හැකි ය. අවසානයේ මේ අන්‍යෝන්‍ය ක්‍රියාවන් මිනිස් සංයුතියේ ඇති වන අර්බුදවලට බලපාන අන්දම ගැන ප්‍රවාද නිර්මාණය කළ හැකි ය.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය හා සසඳන විට බටහිර සමාජ විද්‍යාවේ ඇති මූලික අඩුපාඩුව නම් නිරීක්ෂකයන් ගේ විවිධත්වය ප්‍රවාදාත්මකව ඉදිරිපත් කිරීමට ඇති නොහැකියාව ය. මේ අඩුව ඔවුන් වසා ගන්නේ වියුක්ත මිනිසුන්ට විවිධ ලේබල ඇලවීමෙනි. ලේබල වෙනස් වුවත් ඔවුන් ගේ ප්‍රවාද තුළ මිනිසුන් අතර අන්‍යෝන්‍ය ක්‍රියාවන් එක ම ආකාරයකට සිදු වේ. (මෙහි වෙනසක් දැකීමට නම් නිරීක්ෂකයන් අතර විවිධත්වය ප්‍රවාදාත්මකව දැනගත යුතු ය.)

ලක්වැසි විවිධ ජන කොටස් එකතු කරගෙන ජාතික අනන්‍යතාවක් ගොඩනගා ගන්නේ කෙසේ ද යන්න අද දවසේ අපට ඇති සමාජ විද්‍යාත්මක ප්‍රශ්නයයි. මෙහි දී බටහිර සමාජ විද්‍යාඥයින් නිර්දේශ කරනු ඇත්තේ අපට ආවේණික සංස්කෘතික, භාෂාමය, ආගමික ආදී ගති ලක්ෂණ, සංකේතවලට සීමා කර වියුක්ත මිනිසුන් ලෙසට එක් වන ලෙස ය. මේ වියුක්ත මිනිසුන් සංස්කෘතික වශයෙන් බටහිර විය යුතු බව ද නො කියා කියනු ඇත. එහෙත් විය යුත්තේ සියලු ජන කොටස් තම ආවේණික ගුණ අත් නො හරිමින් එක් ජාතියකට අවශෝෂණය වීම ය. මෙය කළ හැක්කේ විවිධත්වය දැකිය හැකි නිර්මාණාත්මක සාපේක්ෂතාව තුළ පමණි.

*එක්සත් ජනපදයේ ඔහායෝහි සින්සිනාටි ළමා රෝහල් වෛද්‍ය මධ්‍යස්ථානයේ*
*ප්‍රතිබිම්බ පර්යේෂණ මධ්‍යස්ථානයේ සහකාර මහාචාර්ය*
**ආචාර්ය ජානක වංශපුර**